දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්ත
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Education, Southern Province

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

පෙරහුරු පරීක්ෂණය- 2022(2023)

13 ශ්‍රේණිය
Grade 13

## නර්තනය - 1 කොටස

පැය 02යි

- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. නිවැරදි ශිල්පක්‍රම භාවිතයෙන් පැනීම් හා කැරකීම් අභ්‍යාසයන්ගෙන් අපේක්ෂා නොකරනුයේ,

1. සාම්ප්‍රදායික අනන්‍යතාලක්ෂණ මතුකර දැක්වීම.
2. නර්තනයේ ශාස්ත්‍රීය ලක්ෂණ ආරක්ෂා කරගැනීම.
3. සාම්ප්‍රදායික අංගහාර හැසිරවීමේ විධි ක්‍රම හඳුනා ගැනීම.
4. සාම්ප්‍රදායික ගුරු ගෙදර අධ්‍යාපනය රැක ගැනීම.
5. නර්තන නිර්මාණකරණයේදී භාවිතයට ගැනීමේ හැකියා වර්ධනය.

02. ඉද්ද, රොද්ද, වවුන්න හා වලුකුර යන රංග භාණ්ඩ භාවිත ශාන්තිකර්ම පෙළපාලිය හා ශාන්තිකර්මය වන්නේ,

1. කපුයක්කාරිය, රටයකුම් යාගය.
2. නානුමුරය, සුනියම් යාගය.
3. විශාලා ශාන්තිය, බලි යාගය.
4. කිල බැදීම, වලියක් මංගල්ලය.
5. පොත්කඩේ යක්කම, කිරිමඩු යාගය.

03. දේශීය තාල පද්ධතිය පිළිබඳව තොරතුරු දැක්වෙන "සිංහල තිත් තාල ක්‍රමය" හා "හෙළගීමග" යන කෘතීන් රචනා කරනලද්දේ කවුරුන් ද?

1. ජේ.සී මාලගම්මන මහතා හා වින්සන්ට් සෝමපාල මහතා.
2. සරත් විජේවර්ධන මහතා හා ඩබ්.බී මකුලොලුව මහතා.
3. ජේ.ඊ සේදරමන් මහතා හා ජේ.ඊ ගුණසේන මහතා.
4. වින්සන්ට් සෝමපාල මහතා හා ලයනල් රංවල මහතා.
5. ඩබ්.ඩී අමරදේව මහතා හා ලයනල් එදිරිසිංහ මහතා.

04. එරන්දතී වර්ණනාව, රත්තේලඹුවේ කවි සහ අටමගලේ කවි ඇසුරෙන් නිර්මාණය වී ඇති ගැමි නැටුම් ලෙස සැලකෙන්නේ,

1. පන්නෙලිම, තාලම් හා මෝල්ගස් නැටුම් ය.
2. ගොයම්, කුළු හා පතුරු නැටුම් ය.
3. සවරම්, තාලම් හා චාමර නැටුම් ය.
4. ගොයම්, කුළු හා මෝල්ගස් නැටුම් ය.
5. පන්නෙලිම, මෝල්ගස් හා ගොයම් නැටුම් ය.

05. කුරුණෑගල යුගයේ නර්තන කලා ඉතිහාසය පිළිබඳ තොරතුරු සඳහන් වන සාහිත්‍ය කෘති දැක්වෙන වරණය තෝරන්න.

1. උම්මග්ග ජාතකය, කව්සිළුමිණ හා කඳවුරු සිරිත.
2. දළදා සිරිත, සිංහල ථූපවංශය හා සගසරණ.
3. උම්මග්ග ජාතකය, දළදා සිරිත හා සිංහල ථූපවංශය.
4. කඳවුරු සිරිත, සද්ධර්මරත්නාවලිය හා චූලවංශය.
5. පූජාවලිය, ථූපවංශය හා සිහබා අස්න.

06. "මැද පෙති පසෙක වටරැස්තරු වළල්ලා" යනුවෙන් වර්ණනා කෙරෙන ශාන්තිකර්ම සැරසිල්ල වනුයේ,

1. සොලොස්මගල යි.
2. රිද්දි පිදේනිය යි.
3. දියකෙළි පිදේනිය යි.
4. නවගැබේ මල්බලිය යි.
5. කිරිමැස්ස යි.

07. "ධාරක" හා "තාරා" යන චරිත ඇතුලත් නර්තන නිර්මාණ කෘතිය හා එහි නිර්මාණ අධ්‍යක්ෂක ලෙස සැලකෙන්නේ,

1. තෘෂ්ණා ආශා, මිරැන්ඩා හේමලතා මහත්මිය.
2. දෙපානෝ ගීත නාට්‍ය, ඩබ්.බී මකුලොලුව මහතා.
3. පටචාරා නිර්මාණය, පිනකී හිල් මහත්මිය.
4. ජේමතෝ ජායති සෝකෝ, එදිරිවීර සරත්චන්ද්‍ර මහතා.
5. වනජා, වජිරා චිත්‍රසේන මහත්මිය.

08. රාජාකර්තා රජු හා නවාබ් වජිද් අලිෂා යන රජවරුන් අනුග්‍රහය දැක්වූ භාරතීය නර්තන සම්ප්‍රදායන් වන්නේ,

1. කථකලි හා මණිපුරි ය.
2. කථක් හා භරත නාට්‍යම් ය.
3. මණිපුරි හා කථක් ය.
4. භරත නාට්‍යම් හා කථක් ය.
5. කථක් හා කථකලි ය.

09. "ලෙලදුන් නවතඹ පලුවන් පාදේ" යන කවිය අයත් වන සංදේශ කාව්‍ය හා රචනා වූ යුගය ලෙස සැලකෙන්නේ,

1. තිසර සංදේශය, ගම්පළ යුගය වේ.
2. මයුර සංදේශය, කෝට්ටේ යුගය වේ.
3. පරෙවි සංදේශය, කෝට්ටේ යුගය වේ.
4. සැවුල් සංදේශය, ගම්පල යුගය වේ.
5. කෝකිල සංදේශය, කෝට්ටේ යුගය වේ

10. ශාන්තිකර්මයන්හි භාවිත වෙස්මුහුණු හා අර්ධ වෙස්මුහුණු අංග රචනයේදී අයත් වන්නේ,

1. ශෛලිගත අංග රචනයට ය.
2. සරල අංග රචනයට ය.
3. ස්ථාවර අංග රචනයට ය.
4. විකාර රූපී අංග රචනයට ය.
5. ස්වාභාවික අංග රචනයට ය.

11. කෝළම් රංගයක "ජේඩිරාළ" හා "පණික්කළ" වශයෙන් හැඳින්වෙන්නේ කුමන කෝළම් චරිතයන් ද?

1. පොලිස් හා මුදලි කෝළම යි.
2. අණබෙර හා ආරච්චි කෝළම යි.
3. හේවා හා කාපිරි කෝළම යි.
4. ජස හා අණබෙර කෝළම යි.
5. අණබෙර හා ජස කෝළම යි.



A



B

12. ඉහත "A" හා "B" ඡායාරූපයන්ගේ දැක්වෙන රංග ආභරණයන් භාවිත නර්තන සම්ප්‍රදායන් දැක්වෙන වරණය තෝරන්න.

1. භරත නාට්‍යම් හා කථකලි නර්තන සම්ප්‍රදායන් ය.
2. කථකලි හා මණිපුරි නර්තන සම්ප්‍රදායන් ය.
3. භරත නාට්‍යම් හා කථක් නර්තන සම්ප්‍රදායන් ය.
4. මණිපුරි හා කථක් නර්තන සම්ප්‍රදායන් ය.
5. කථක් හා භාරත නාට්‍යම් සම්ප්‍රදායන් ය.

13. රංගවස්ත්‍ර නිර්මාණයේදී නිර්මාණ කරුවෙකුගේ අවධානයට පාත්‍රනොවිය යුත්තේ මින් කුමක් ද?

1. සාම්ප්‍රදායික වස්ත්‍රාභරණයන්හි අනන්‍යතාලක්ෂණ පමණක්ම යොදා ගැනීම කෙරෙහි ය.
2. සංස්කෘතික වපසරිය සාරධර්ම හා සදාචාර ධර්මතා කෙරෙහි ය.
3. දේහ විද්‍යාත්මක සැලැස්ම හා සිරුරේ හැඩතල පිහිටන ආකාරය කෙරෙහි ය.
4. සාම්ප්‍රදායික වර්ණ, අලෝක වර්ණ හා ද්‍රව්‍ය වර්ණ භාවිතය කෙරෙහි ය.
5. නර්තන චලන ක්‍රියාවලිය හා නර්තන ශක්‍යතා ප්‍රදර්ශනයට යෝග්‍ය වීම කෙරෙහි ය.

14. "14 වන ලුවී රජුගෙ" රජ වාසලෙහි බැලේ නර්තන නිර්මාපකයින් ලෙස කටයුතු කරන ලද්දේ කවුරුන් ද?

1. බැල්තසාපි බියුජොක්ස් හා පියරේ බියුචැම්ප් ය.
2. බැල්ඩස්සරිද බෙල්ජියෝ හා මාරියස් පෙටිපා ය.
3. පීන් බැප්ටිස් ලිලී හා පියරේ බියුචැම්ප් ය.
4. වෙකොවුස්කි හා මයිකල් ෆෝකින් ය.
5. වස්ලව් නිජින්ස්කි හා ඉසඩෝරා ඩන්කන් ය.

15. "වන්නකුරාළ" මූලික වන ශාන්තිකර්මය ලෙස සැලකෙන්නේ,

1. වලියක් මංගල්‍ය යි. 2. සන්නියකුමේ යාගය යි. 3. සූනියම් යාගය යි. 4. බලි යාගය යි.
5. කිරිමඩු යාගය යි.

16. "බෝකොට මඩුවක් බිම පේ කරතී" මෙම ගායනය,

1. බලි ශාන්තිකර්මයේ බලි මඩුපුරයේ කවිය කි.
2. වලියක් මංගල්‍යයේ සොලොස්මඟලේ කවිය කි.
3. රටයකුම් යාගයේ කළුකුමාර බලිය පවාදීමේ කවිය කි.
4. කිරිමඩු යාගයේ කිරි ඉතිරවීමේ කවිය කි.
5. සන්නියකුම් යාගයේ සන්නිපිදේනි කැපකිරීමේ කවිය කි.



A



B



C

17. ඉහත ඡායාරූපයන්ගෙන් දැක්වෙන ශාන්තිකර්ම ආශ්‍රිත චරිතයන් වන්නේ,

1. වඩිග බමුණා, රිද්දි බිසව හා මරු සන්නි යක්ෂයා ය.
2. වඩිග බමුණා, සූනියම් යක්ෂණිය හා මහාකෝළ සන්නි යක්ෂයා ය.
3. වඩිග බමුණා, කලස් පාළිය හා මහසොහොන් යක්ෂයා ය.
4. වඩිග බමුණා, රිද්දි බිසව හා වාත සන්නි යක්ෂයා ය.
5. වඩිග බමුණා, කලස් පාළිය හා ගරා යක්ෂයා ය.

18. "විර මුණ්ඩ දෙවි වඩින්න - සියළු දෝස දුර හරින්ඩ" යන කවි පදයන්හි ලඝු, ගුරු මාත්‍රා හා සදැස් මාත්‍රා සංඛ්‍යාව දැක්වෙන වරණය තෝරන්න.

1. ලඝු මාත්‍රා 14, ගුරු මාත්‍රා 05, සදැස් මාත්‍රා 24 කි.
2. ලඝු මාත්‍රා 15, ගුරු මාත්‍රා 04, සදැස් මාත්‍රා 23 කි.
3. ලඝු මාත්‍රා 16, ගුරු මාත්‍රා 03, සදැස් මාත්‍රා 22 කි.
4. ලඝු මාත්‍රා 12, ගුරු මාත්‍රා 06, සදැස් මාත්‍රා 24 කි.
5. ලඝු මාත්‍රා 18, ගුරු මාත්‍රා 02, සදැස් මාත්‍රා 22 කි.

19. රංග වින්‍යාසය හා සබැඳි මූලික සංකල්පයන් ලෙස සැලකෙන්නේ,

1. චලනය, අවකාශය හා තල භාවිතය වේ. 2. අවකාශය, රිද්මය හා චලනය වේ.
3. ශරීරය, චලනය හා අභ්‍යාසය වේ. 4. චලනය, අවකාශය හා සම්බන්ධතා වේ.
5. අංග, ප්‍රත්‍යංග හා අභිචලන වේ.

20. ඓතිහාසික මුල්ලේරියා සටන පදනම්කර රචිත පරංගි හටන පද්‍ය සංග්‍රහය රචනා කරන ලද්දේ,

1. අලගියවන්න මුකවෙටි කවියා ය. 2. වැත්තෑවේ හිමියන් ය.
2. ටිබෙට් ජාතික ඇස් මහින්ද හිමි ය. 4. රම්මොලවක අධිකාරම් ය.
5. ගණිතාලංකාර පඬිවරයා ය.

21. නර්තන ප්‍රභවයෙහි ලා පිව විද්‍යාත්මක සාධකයන්ගේ බලපෑම පිළිබඳ අදාල නොවන ප්‍රකාශය ඇතුලත් වරණය තෝරන්න.

1. මානව දේහයේ රිද්මයානුකූල ක්‍රියාවලින් මිනිසාගේ චලනයට පෙළඹුමක් ඇති කරයි.
2. චලනය හා චිත්තවේග අතර ඇත්තේ අන්තර් ක්‍රියාවලිය කි.
3. නර්තකයාගේ චිත්තවේග ප්‍රචාරණය මගින් නරඹන්නන් තුළ ශාරීරික කම්පනයක් ඇති වේ.
4. උත්තේජනයට ප්‍රතිචාරයක් ලෙස "චලනයට" පෙලඹුමක් ඇති කරයි.
5. මූලික මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමේදී ආණුකරනාත්මක හා සමාරෝපි නර්තනයන් මූලික වේ.

22. බලි ශාන්තිකර්මයේ හිරු, කිවි හා කුජ ග්‍රහයින්ගේ විමානයන් ලෙස සැලකෙන්නේ,

1. ඉඹුල්, කරඳ හා කොළොන් වෘක්ෂයන් ය. 2. කරද, බෝ හා රඹ වෘක්ෂයන් ය.
3. දිවුල් කොහොඹ හා නුග වෘක්ෂයන් ය. 4. නුග, වැටකේ හා කොසඹ වෘක්ෂයන් ය.
5. ඉඹල්, කොළොන් හා දිවුල් වෘක්ෂයන් ය.

23. භරත නාට්‍යම්හි සුවිශේෂ සංස්කෘතික පුණරුදයක් ඇති කිරීමෙහිලා දායක වූ කලා ශිල්පිනිය කවුරුන්ද?

1. ශ්‍රීමතී මේනකා 2. රුක්මණීදේවි අරුන්ඩේල් 3. පද්මා සුබ්‍රමනියම් 4. බාල සරස්වතී
5. සිරිමතී රසාදරී


A


B

24 ඉහත " ඡායාරූපයන්ගේ දැක්වෙන ශාන්තිකර්ම සැරසිලි අංගයන් නම් කරන්න.

1. කපාල කුඩුව හා ප්‍රේත පිදේණිය. 2. පිදේනි මැස්ස හා කත්තිරික්කය.
3. පිදේනි මැස්ස හා කපාල කුඩුව. 4. කත්තිරික්කය හා නවමල්පාය.
5. කුමාර පිදේණිය හා වටකුමාර විදිය.


A


B


C

25. ඉහත "A", "B" හා "C" ඡායාරූපයන්ගේ දැක්වෙන කෝළම් චරිතයන් පිළිවෙලින් නම් කරන්න.

1. කාපිරි, හේවා හා නොංචි කෝළම් වේ.
2. පොලිස්, අණබෙර හා නොංචි කෝළම් වේ.
3. හේවා, පොලිස් හා ලෙංචිනා කෝළම් වේ.
4. මුදලි, කාපිරි හා නොංචි කෝළම් වේ.
5. පොලිස්, ජස හා නොංචි කෝළම් වේ.

➢ **අංක 26 සිට 35 තෙක් ප්‍රශ්න වලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. දේශිය නර්තන අධ්‍යාපනයේ පුනරුදයට හේතුවූ හොරණ ශ්‍රී පාළි ආයතනය .................................... මහතා විසින් ආරම්භ කරනු ලැබිය.

27. බැලේ රංගනයේදී අඳිනු ලබන වළළුකර දක්වා දික්වූ ඇඳුම.................................................................. නමින් හැඳින්වේ.

28. ආලෝකකරණයේ සියලුම පහන් වල දීප්තිය පාලනයෙහිලා ..........................................ය නම් උපකරණය භාවිත කරයි.

29. ආඝාතයට පෙර ගායනය ආරම්භ කිරීම .................................................................................................. ග්‍රහ නම් වේ.

30. තම්මැට්ටම වාදනය පුහුණුවේදී ................................................................................. නම් ආධාරකය ඇසුරු කරගනී.

31. රස නිශ්පත්තියේදී ස්ථායි භාවයන්ට සමාන්තරව පහළ වන අස්ථාවර භාවයන් ................................. භාව නමින් හැඳින්වේ.

32. මහාචාර්‍ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය විසින් ......................................................................... වන්නම රචනා කරන ලදී.

33. "නුගේ හැල්ල" ............................................................................................... ශාන්තිකර්මයේ සුවිශේෂ ගායන අවස්ථාවකි.

34. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ........................................................... එළිමහන් රංග පීඨය ග්‍රීක රංගභූමි ආකෘතිය අනුව නිම වූවකි.

35. නර්තනයේ ප්‍රයෝගික භාවිතයන් සටහන් කර දැක්වීමේ විධි ක්‍රමය ................................................................. නම් වේ.

➢ **අංක 36 සිට 50 තෙක් ප්‍රශ්න වලට අදාල පිළිතුර හිස් ඉරි මත ලියන්න.**

36. "දුන් සුමන විවරණ - කන්ද සුරිදුගෙ බලයෙන" යන කවියෙන් නිරූපිත චරිතය හා ඊට අදාළ ශාන්තිකර්මය නම් කරන්න?

1. චරිතය - ............................................ 2. ශාන්තිකර්මය - ............................................

37. තාක්ෂණික දියුණුවත් සමග නූතණයේ භාවිත අංග රචනා ක්‍රමවේද දෙක නම් කරන්න.

1. ............................................ 2. ............................................

38. කන්නගි දේවිය හා මුරුගන් දෙවියන් උදෙසා ඉදිරිපත් කෙරෙන ද්‍රවිඩ ජන නැටුම් දෙක දක්වන්න.

1. කන්නගි දේවිය - ................................ 2. මුරුගන් දෙවියන් - ................................





39. "A" හා "B" ඡායාරූපයන්ගේ දැක්වෙන නර්තන සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නම් කරන්න.

1. A - ............................................ 2. B - ............................................

40. නර්තන ඉතිහාසය සම්බන්ධ රූකම් දැකියහැකි "හැටදාගෙය" හා "රිදී විහාරය" අයත් වන ඓතිහාසික යුගයන් දක්වන්න.

1. හැටදාගෙය - ................................ 2. රිදී විහාරය - ................................

41. මෝල්ගස් නැටුම හා පතුරු නැටුම ප්‍රසංග වේදිකාවට උචිත ලෙස නිර්මාණය කරන ලද්දේ කවුරුන් ද?

1. මෝල්ගස් නැටුම - ..................................... 2. පතුරු නැටුම - .....................................

42. රංග සැරසිලි අතර "පූනා විදිය" හා "පත්තිරිප්පුව" යන සැරසිලි දැකිය හැකි ශාන්තිකර්මයන් වන්නේ,

1. පූනා විදිය - ..................................... 2. පත්තිරිප්පුව - .....................................

43. "පත්තිනි දෙවිඳුගෙ සලඹ වලල්ලා - සලඹ වලල්ලා" යන කවි පදයේ සදැස් මාත්‍රා හා ගී මාත්‍රා සංඛ්‍යාව දක්වන්න.

1. සදැස් මාත්‍රා - ..................................... 2. ගී මාත්‍රා - .....................................



44. ඉහත ඡායාරූපයේ දැක්වෙන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය නම් කර එය අයත්වන ඓතිහාසික යුගය නම් කරන්න.

1. මූලාශ්‍රය - ..................................... 2. යුගය - .....................................

45. මුල් මාතෘය අන්තර්ගත නර්තන සම්ප්‍රදාය සහ එහි සාම්ප්‍රදායික බෙර පදය ලියා දක්වන්න.

1. සම්ප්‍රදාය - ..................................... 2. බෙරපදය - .....................................

46. රීරි යක්ෂයා හා සූනියම් යක්ෂනිගේ රංග වස්ත්‍රාභරණයන් හි භාවිත වර්ණයන් ලියා දක්වන්න.

1. රීරි යක්ෂයා - ..................................... 2. සූනියම් යක්ෂනිය - .....................................

47. වලයම හා කුන්දිරම්පල්ල යන කොටස් දක්නට ලැබෙන වාද්‍ය භාණ්ඩයන් නම් කරන්න.

1. වලයම - ..................................... 2. කුන්දිරම්පල්ල - .....................................

48. "අත්තන මලසේ..." හා "සසිර සිරි ලක...." යන ගායන අන්තර්ගත නර්තන අංග දෙක නම් කරන්න.

1. අත්තන මලසේ - ..................................... 2. සසිර සිරි ලක - .....................................

49. "මී අඹ නොලැබුන කෝපයෙන් හා වෛරයෙන් ඇලලී ගිය දාසිය රජුගේ පෙරමගට ගොස් ගතු කේලම් කියයි" මින් නිරූපිත භාවය හා රසය දක්වන්න.

1. භාවය - ..................................... 2. රසය - .....................................

50. 1 2 / 1 2 / 1 2 3 හා 1 2 / 1 2 / 1 2 / 1 2 3 4 / 1 2 3 4 යන තාල රූපයන්ගේ තාල සංඥාවන් ලියා දක්වන්න.

1. 1 2 / 1 2 / 1 2 3 - .....................................
2. 1 2 / 1 2 / 1 2 / 1 2 3 4/ 1 2 3 4 - .....................................

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්ත
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Education, Southern Province
දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්ත
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Education, Southern Province

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

Department of Education, Southern Province

පෙරහුරු පරීක්ෂණය- **2022(2023)**

| | | |
|---|---|---|
| 13 **ශ්‍රේණිය**<br>Grade **13** | නර්තනය- **11**කොටස | **පැය** 03යි |

**උපදෙස්,**

* මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් **කොටස් 03 කින්** සමන්විත වේ.

* **I** කොටස් **1** සහ **2** ප්‍රශ්න **අනිවාර්ය** වේ.

* **II** හා **III** කොටස් වලින් අවම වශයෙන් එක් **ප්‍රශ්නය බැගින්** හෝ තෝරාගෙන, **අනිවාර්ය ප්‍රශ්න දෙක ද, ඇතුළුව ප්‍රශ්න පහකට** පිළිතුරු සැපයිය යුතුය.

* සෑම ප්‍රශ්නයකම I කොටසට **ලකුණු 06ක්** ද, II කොටසට **ලකුණු 06ක්** ද, III කොටසට **ලකුණු 08ක්** ද, වශයෙන් **මුළු ලකුණු 20ක්** බැගින් හිමි වේ.

## I - කොටස

1) i. පහත සඳහන් බෙර පද අතුරින් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙරපදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

   අ) තකුජිං ගත්තත් තරිකිට කුංතක

   ආ) දොං තත් දිතගත ගදිතකු දොං ගත

   ඉ) ජිං ජිං තක් කරතක තක්කිට ජිමිතකු

ii. පහත සඳහන් කවිපද "විෂමග්‍රහ" අනුව මාත්‍රා 3+4 තාලයට ප්‍රස්තාර කරන්න.

   " මෙලෙසින් මල් මද දෙව්යේ - යුධයට කොඩි බැද ඒව්යේ"

iii. මයුරා වන්නමේ අඩව්ව හෝ ශුද්ධ මාත්‍රයේ අවසාන ඉරට්ටිය හෝ අටකුරු ගාහක වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

2) ශ්‍රී ලංකික නර්තනයේ ඓතිහාසික පසුබිම විවිධ මූලාශ්‍ර අධ්‍යයනයෙන් හඳුනාගත හැක

i. ප්‍රාග් බෞද්ධ හා පශ්චාත් බෞද්ධ යුගයේ නර්තනය පැවති තත්වය පිළිබඳ සාධක දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

ii. කෝට්ටේ යුගයේ ශාන්තිකර්ම ක්ෂත්‍රයේ ඇති වූ ප්‍රවර්ධනය පිළිබඳ සාධක දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න.

iii. "1970 දශකයේ නර්තන කණ්ඩායම් බිහිවීම හා අධ්‍යාපණික වශයෙන් ප්‍රවර්ධනය කැපී පෙනේ" මින් එක් එක් කේෂත්‍රයට අදාලව සාධක දෙක බැගින් දක්වා විමසුමට ලක් කරන්න.

## II - කොටස

3) විවිධ සමාජ විශ්වාස පදනම් කර ගත් දේශීය ශාන්තිකර්ම ඊට ආවේණික ලක්ෂණ ප්‍රදර්ශනය කරයි.

i. **කිරිමඩු යාගය** හා බැදි ඇදහිලි විශ්වාසයන් චාරිත්‍ර විධි දෙකක් ඇසුරෙන් පැහැදිළි කරන්න.

ii. "**ඌරා යක්කම** හා **පොත්කඩේ යක්කම** මගින් ගැමි ජන සමාජයේ විවිධ පැතිකඩ විවරණය කෙරේ" විමසන්න.

iii. වලියක් මංගල්‍ය ශාන්තිකර්මය සඳහා සාම්ප්‍රදායික සමාජ දායකත්වය හිමිවන ආකාරය අගයන්න.

4) ශාන්තිකර්ම වූ කලී විවිධ කලා සම්ප්‍රදායන් ඇසුරු කරගත් සංස්කෘතිකාංගයකි.

i. **සන්නි යකුමේ** තෝරාගත් යක්ෂ චරිත දෙකක් ඇසුරෙන් රස හා භාව නිරූපණය වන ආකාරය විමසන්න.

ii. බලි ඇදුරාගේ සුවිශේෂ භූමිකාව පිළිබඳ, පෞර්ෂය ලක්ෂණ හා ශිල්පීය කුසලතා ඇසුරෙන් ඇගයීමක් කරන්න.

iii. රට යකුම යාගයේ රංග සැරසිලි හා රංග භාණ්ඩයන්ගේ කලාත්මක ලක්ෂණ අගයන්න.

5) ගැමි නැටුම් හා ගැමි නාටක දේශීය අනන්‍යතාව, සංස්කෘතිය පිළිබිඹු කරනු ලබන කලා අංගයන් ය.

i. තෝරාගත් සිංහල ගැමි නැටුම් දෙකක ගායන ඇසුරෙන් ගැමි සමාජ සාරධර්ම නිරූපණය වන අයුරු විමසන්න.
ii. **කාවාඩි හා කෝලාට්ටම්** නර්තනයන් හි දක්නට ලැබෙන විශේෂතා **දෙක** බැගින් විමසුමට ලක් කරන්න.
iii. හාස්‍ය හා උපහාසය මතු කිරීමෙහිලා නර්තනය, ගායනය නිර්මාණශිලී ලෙස කෝලම් කරුවා ඇසුරු කර ගනී. **ජස කෝලම හා නොංචි කෝලම** ඇසුරින් විචාරයට ලක් කරන්න.

## III - කොටස

6) පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස් වලට අදාළව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| ශබ්දම් | ශාප්මෝචන් | මහා පීටර් රජු |
| තරාණා | බැරිසිල් | II හෙන්රි රජු |
| ඨුම්රි | ජීවන රිද්මය | XIV වන ලුවී රජු |
| තිල්ලානා | කල්පනා | ඇලෙක්ෂියස් රජු |

i. **(අ) කොටස** - කථක් නර්තන සම්ප්‍රදායට අයත් නෘත්‍ය අංගය තෝරා ඒ පිළිබඳ විස්තර කරන්න.
ii. **(ආ) කොටස** - දේශිය මුද්‍රානාට්‍ය නිර්මාණ කෘතිය තොරාගෙන එහි දේශියත්වය මතුකිරීමට යොදාගත් නිර්මාණ ශිල්ප විධික්‍රම සාකච්ඡා කරන්න.
iii. **(ඉ) කොටස -** ප්‍රංශයේ බැලේ රංග කලාව ප්‍රවර්ධනයෙහිලා පුරෝගාමී වූ රාජ්‍ය පාලකයාගේ දායකත්වය අගයන්න.

7) "නිර්මාණ කෘතියක ප්‍රාසංගිකත්වය උද්දීපනය සඳහා අනුෂාංගික කලාවන් ප්‍රබලව දායක වේ".

i. තෝරාගත් නාට්‍ය ශෛලීන් දෙකක රූපණයෙහහි ලා නර්තන භාවිතය පිළිබද සාකච්ඡා කරන්න.
ii. "දේශිය වන්නම් කේෂත්‍රය, අධ්‍යතනයේ ප්‍රබල ලෙස නිර්මාණකරණයට බඳුන්ව පවතී" විමසන්න.
iii. තෝරාගත් රංග වසත්‍රාභරණයක සාම්ප්‍රදායික ලක්ෂණ අගය කොට එය නිර්මාණය කිරීමේ ශිල්පක්‍රම, පියවර වශයෙන් දක්වන්න.

8) ජනමාධ්‍යන්ගේ දායකත්වය නර්තනයේ නව ප්‍රවනතාවන්ට ප්‍රබලව ඉවහල්ව ඇත.

i. "කලාවක් ලෙස සිනමාව තුල නර්තනය වැදගත් ස්ථානයක් හිමි කර ගනී" විමසන්න.
ii. දේශිය නර්තනය හා සබැදි සමාජ සංස්කෘතික වටිනාකම් සමාජගත කිරීම සඳහා ජනමාධ්‍ය දායක වේද? අදහස් දක්වන්න.
iii. අධ්‍යතන නර්තනයන්හි සංගීතය හා තාකෂණය භාවිතයේ නිර්මාණශිල්පී ලක්ෂණ අගයන්න.